## Abstract 39

# චීන භික්ෂුණී ශාසනයේ ආරම්භය විෂයයෙහි ශ්‍රී ලංකාවේ දායකත්වය

**ඒ. එම්. ප්‍රසාදි අප්සරා අදිකාරම්,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*apsaraprasadi89@gmail.com*

බුදුරදුන් ධරමාන යුගයෙහි ම භාරතයෙහි භික්ෂුණී ශාසනය ආරම්භ වූ බව ශාසන ඉතිහාසයෙන් පෙනේ. එසේ ආරම්භ වූ භික්ෂුණී ශාසනය බුදුසමයයේ සම්ප්‍රාප්තියත් සමග ආසියාතික රටවල් ගණනාවක විකාශනය වූ බව කිව හැකි ය. **මහාප්‍රජාපතී** ගෝතමීයගේ පුරෝගාමීත්වයෙන් ඇරඹි භික්ෂුණී ශාසනය ශ්‍රී ලංකාව හරහා චීනයට ව්‍යාප්ත වන්නේ තරමක් පසුකාලීනව ය. ක්‍රිස්තු පූර්ව පළමු වන ශතවර්ශයේ දී චීනයට බුදුදහම ලැබුණු අතර ක්‍රි.ව හතරවන සහ හත්වන සියවස් අතර පමණ චීනයේ බුදුදහම පූර්ණ වශයෙන් ස්ථාපිත වූ බව පෙනේ. එහි භික්ෂු ශාසනය ස්ථාපිත වූයේ ද ක්‍රිස්තු වර්ෂ 250 දී පමණ වේ. චීන භික්ෂුණී ශාසනයේ ආරම්භය විෂයයෙහි එරට භික්ෂූන්ගේ දායකත්වය ද මෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ඒ අතර **ගුණවර්මන්** නම් භික්ෂුවගේ කාර්යභාරය සුවිශේෂ වේ. චීනයට භික්ෂුණී ශාසනය දායාද වන්නේ ක්‍රිස්තු වර්ෂ 429 දී ය. ලංකාවෙන් චීනයට ගිය භික්ෂුණීන් නිසා චීන භික්ෂුණී ශාසනයේ ආරම්භය සිදු වූ බව ඓතිහාසික වාර්තාවන්හි සඳහන් වේ. ක්‍රිස්තු වර්ෂ 433 දී ශ්‍රී ලංකාවේ **දේවසාරා** භික්ෂුණියගේ ප්‍රධානත්වයෙන් එකළොස් නමක් චීනයට වැඩම කර භික්ෂුණී උපසම්පදා විනය කර්මය සිදු කොට තිබේ. මෙහි දී පළමුව උපසම්පදාව ලැබූවේ ''**පාම්ශියෙන්**'' නම් මෙහෙණියක බව වාර්තා වේ. එම උපසම්පදා විනය කර්මය සිදු වී ඇත්තේ **ධර්මගුප්ත** නම් නිකායයට අයත් සාම්ප්‍රදායික ලක්ෂණයන්ට අනුකූලව ය. චීන ජාතික භික්ෂුණීන් තුන්සීයකට වැඩි ප්‍රමාණයක් ලංකාවේ භික්ෂුණීන්ගෙන් උපසම්පදාව ලබාගෙන ඇති බව ක්‍රිස්තු වර්ෂ 526 දී පමණ ''**පාඕ වාන්**'' විසින් සම්පාදිත ''**පි-චියු-නි-චුආන්**'' කෘතියේ සඳහන් වේ. චීන භික්ෂුණී චරිතාපදාන කෘතියේ සඳහන් වන අයුරින් එකල පහළ වූ සිල්වත් භික්ෂුණීහු සියල්ලෝ ම ගැඹුරු නුවණින් සහ දැහැමි චරිතයෙන් යුක්ත වූහ. මේ අනුව චීනයේ භික්ෂුණී ශාසනයේ ආරම්භය සහ ව්‍යාප්තිය විෂයයෙහි ශ්‍රී ලාංකික භික්ෂුණීන්ගෙන් සුවිසල් දායකත්වයක් සැපයී ඇති බව කිව හැකි ය. එබැවින් චීන-ලංකා සම්බන්ධතාව යාවත්කාලීන කිරීම විෂයයෙහි භික්ෂුණී ශාසනික තොරතුරු පාදක කරගත හැකි ආකාරය විමසීම මෙම පර්යේෂණයෙන් මූලික වශයෙන් අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද :** උපසම්පදාව, චීනය, පැවිද්ද, බුදුදහම, ශ්‍රී ලංකාව